සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]



**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය**
*மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்*
**Western Provincial Education Department - Colombo Educational Zone**

**දෙවන වාර ඇගයීම -2016**
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation -2016**

| | | |
|---|---|---|
| 10ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රය<br>சிங்கள மொழியும் இலக்கியமும் வினாத்தாள் -1<br>Sinhala Language & Literature Paper 1 | *පැය එකයි*<br>*ஒரு மணித்தியாலங்கள்*<br>*Two Hours* |

**සැලකිය යුතුයි**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ඒ සඳහා ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.)**
- **මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

❖ **ඉරි ඇඳි පදවල අර්ථය සොයන්න.**

(01) පුරාණ කාලයේ සියලු සිරිත්විරිත් <u>කෝපි කාලයේ වැඩ</u> යැයි අත්හැරීම සුදුසු නොවේ.
1. වැඩකට නැති වැඩ  2. යල් පැන ගිය වැඩ
3. කෝපි බොන විට කරන වැඩ  4. කෝපි වැවූ යුගයේ වැඩ

(02) ඇතැම් ආයතන ප්‍රධානීහු තම සේවකයන්ට <u>සුදු එළුණු පොඩිකරමින්</u> සේවා අයිතීන් නොදී පීඩාවට පත් කරති.
1. බොරුවෙන් මුලා කරමින්  2. ඇත්ත බොරු කරමින්
3. ආයතනය වසා දමමින්  4. සේවකයන් කුපිත කරමින්

(03) ඔහු අප සමඟ අමනාප වී <u>පැදුරටත් නොකියා ම</u> යන්නට ගියේය.
1. ඉතා නිහඬ ව  2. පැදුර දෙස නොබලාම
3. කිසිවකුටත් නොකියා ම  4. හිමිදිරි පාන්දරම

(04) තම දියණියගේ සරණ මංගල්‍යය ඉතා ඉහළින් පවත්වන බව පැවසූ ගුණපාලගෙන් කපුමහතා දැවැද්ද ගැන විමසා සිටි කල, <u>ඇසල පෙරහරට බෙරත් හිඟදැයි</u> ගුණපාල පවසා සිටියේ ය.
1. සරණ මංගල්‍යයට බෙර ඇති බව
2. සියල්ල සම්පූර්ණ බව
3. පෙරහැරේ බෙර හිඟ වූ බව
4. ඇසළ මාසයට බෙර ගසන්නේ නැති බව

❖ **අංක (05) – (07) තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(05) රචකයා තම …………….. මෙහෙයවා තමා ලත් අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරයි.
1. හේතුඵල සබඳතා  2. සිද්ධීන් සමුදාය
3. ආස්වාදය  4. පරිකල්පනය

(06) නිදහස් රාජ්‍යය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් …………….. කිරීමේ කර්තව්‍ය සුදු ජාතිකයෙකුට පැවරිණි.
1. ප්‍රදානය  2. සැකැස්මේ  3. සම්පාදනය  4. සාකච්ඡා

අ.පි.බ.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]



(07) කෙත් වතුවල වැඩ කිරීම කොතරම් උසස් කෙනෙකුට වුවත් ............ කාරණයක් නොවේ .
1. නින්දාවට 2. උමතුවට 3. කම්මැලිකමට 4. සාකච්ඡාවට

(08) නිවැරදි නාම ප්‍රකෘතිය හා ක්‍රියා ප්‍රකෘතිය ඇතුළත් පද පේළිය සොයන්න .
1. කොල්ලෝ - කොලු
   නටන්න - නටනු
2. නැයන් - නැයා
   ඉරයි - ඉරා
3. නලාවලින් - නලා
   අමතයි - අමත
4. යක්ෂයින් - යක්ෂ
   උපුටයි - උපුටා

❖ **පහත අක්ෂර ගොනු සඳහා සිංහල හෝඩියේ සඳහන් වන නම් පිළිවෙළින් සකසන්න .**

(09) ශ ෂ ස හ ෆ / ය ර ල ව / අ ඇ ඉ උ / ඛ ඡ ඨ ථ ඵ
1. අන්තඃස්ථාක්ෂර /වර්ගාක්ෂර/කෙටි ස්වර/මහප්‍රාණ අක්ෂර
2. ඌෂ්මාක්ෂර/ අන්තඃස්ථාක්ෂර /කෙටි ස්වර /මහප්‍රාණ අක්ෂර
3. ඌෂ්මාක්ෂර/ අන්තඃස්ථාක්ෂර/ මහප්‍රාණ අක්ෂර/කෙටි ස්වර
4. අන්තඃස්ථාක්ෂර/කෙටි ස්වර/වර්ගාක්ෂර/ මහප්‍රාණ අක්ෂර

(10) අකාරාදී පිළිවෙළට සැකසූ වචන පේළිය සොයන්න.
1. ධනපාල, කාළුදාසි, සීවලී, දෙව්දත්
2. කළු ගඟ, ගිංගඟ, මහවැලි ගඟ, වලවේ ගඟ
3. බලවතා, දුබලයා, දිළින්දා, ධනවතා
4. උකුස්සා, අලියා, ඔටුවා, ඉත්තෑවා

(11) දී ඇති වචන ගොනුවෙන් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය වන්නේ ,
1. චෛතියසර , පයෝමාසර ,වාලිකාංගණ , කාර්මීකරණ
2. අර්ධස්වර ,විසර්ගය, ඝෝෂ , ගතකුරු
3. නැතුං ,කැටුං ,යා කොය් , දුටා
4. අවිආයුධ , තැගිබෝග , උදවුපදවු , රටතොට

❖ **12, 13 ප්‍රශ්නවල ඇති අක්ෂර වින්‍යාසය වැරදියට ලියා ඇති වචන පේළිය සොයන්න.**

(12) 1. සශ්‍රීක, නිර්මල,ථූපාරාමය, පැදකුණු
2. උෂ්ණත්වය, උණුසුම, සීතල, කාලගුණය
3. කුලුගෙය , බද්දමාලක, සුකවිහරණය, ස්‍රාවක
4. නිර්මාණශීලී, ශ්‍රේෂ්ඨ, ග්‍රන්ථය , දරසෑය

(13) 1. මුඛ්‍යාර්ථ ,නිධානය ,සුඛනම්‍ය , මහාධිකරණය
2. මඳ සුළඟ ,රලපෙල ,සිසිළස, යථාර්තය
3. ඛේදවාචකය ,බෝධිසරය ,අභිජාත ,සිද්ධාර්ථ
4. පෝෂණය , අබරණ , පරිගණකය , තෘෂ්ණාව

(14) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන වැරදි පද පිළිවෙළ ඇතුළත් වරණය වන්නේ ,
1. සු කු ම් රා ස
2. මා ව අ ය න
3. රි ර් ප පූ ණ
4. ලි ත සු ල ල

අ.පි.බ.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]



❖ **ඉරි ඇඳි පදවල ව්‍යාකරණ වර්ගය පිළිවෙළින් ඇති පද පේළිය තෝරන්න .**

(15) ප්‍රතිභා පූර්ණ ගීත රචකයින් අතින් <u>ලියැවුණු</u> දේශාභිමානී සාහිත්‍යය ප්‍රබන්ධ <u>සාහිත්‍යමය</u> ගුණයෙන් ද <u>සුපෝෂිත</u> වීම විශේෂත්වයකි .

1. කෘදන්ත , තද්ධිත , නිපාත , උපසර්ග
2. කෘදන්ත , තද්ධිත , නිපාත , ප්‍රයෝජ්‍ය ක්‍රියා
3. තද්ධිත , කෘදන්ත , නිපාත , උපසර්ග
4. කෘදන්ත , උපසර්ග , නිපාත , තද්ධිත

(16) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා,ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධික්‍රියා අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. ලියමින් , ගයා , කරව , දුවවයි
2. ලියමින් , කරව , ගයා , දුවවයි
3. කරව , ගයා , බලනු , කරව
4. ලියමින් , ගයා , දුවවයි , කරව

(17) ශිල්පියෙකු , ඇතැමෙක් , කළහොත් , සොරමුළ මේවා පිළිවෙළින් හැඳින්වෙන නම් ,

1. අනුක්ත පදයකි , ප්‍රයෝජ්‍ය ක්‍රියා පදයකි , නිත්‍ය බහුවචන පදයකි , සමූහාර්ථවාචී පදයකි
2. අනුක්ත පදයකි, අසම්භාව්‍ය ක්‍රියා පදයකි , නිත්‍ය බහු වචනයකි , සමූහාර්ථවාචී පදයකි
3. අනුක්ත පදයකි , නිත්‍ය බහුවචන පදයකි , අසම්භාව්‍ය ක්‍රියා පදයකි , සමූහාර්ථවාචී පදයකි
4. උක්ත ස්වරූප පදයකි ,නිත්‍ය බහු වචනයකි , අසම්භාව්‍ය ක්‍රියා පදයකි , සමූහාර්ථවාචී පදයකි

(18) උත්තම පුරුෂ , මධ්‍යම පුරුෂ , ප්‍රථම පුරුෂ, සහ ස්ත්‍රී ලිංග බහුවචන පද පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

1. මම , ඔහු , තොපි , ඕ තොමෝ
2. මම , තොපි , ඔහු , බිසව් තුමූ
3. අපි , බිසව් තුමූ , ඔහු , සෙබඩක්
4. අපි , බිසව් තුමූ , තොපි, සෙබඩක

❖ **19,20 යන ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමානාර්ථ පද නොමැති පිළිතුර තෝරන්න.**

(19)
1. ඇත් - ගජ , කණේරු , වරණ , හස්ති
2. සිංහ - කේසර , සිහ , මිගිඳු , බාසුරු
3. මිතුරු - සඳ , මිත්‍ර , යහළු , පසමිතුරු
4. හිරු - දිනකර , දිවයුරු , ගහමිණි , දිනමිණ

(20)
1. අඹ - ඇඹුල් , ස්ත්‍රිය , කඹය , ජලය
2. පා - ප්‍රාසාදය , පතුල , පාත්‍රය ,පාපය
3. සත් - සත , ශාස්ත්‍රය , ආයුධය , යහපත්
4. පිය - පියා , ප්‍රිය , ඇසිපිය , වසාගැනීම

(21) විරුද්ධාර්ථ පද යුගල අතරින් වැරදි අර්ථ සහිත පද යුගලය ඇතුළත් වරණය තෝරන්න.

1. අගාරික - අනගාරික / ජාතික- විජාතික / විකසිත- මුකුලිත / හරණ -අපහරණ
2. ආශ්‍රිත - අනාශ්‍රිත / වංක -අවංක / පූර්ව-පශ්චිම/ අවුල් -නිරවුල්
3. ආලෝකය - ප්‍රභාව / දොම්නස - සොම්නස / බල-ප්‍රබල /මිහිරි -කටුක
4. උච්ච - නීච / නානාමතික -ඒකමතික / දක්‍ෂ-අදක්‍ෂ / යහපත් -අයහපත්

(22) රාත්‍රී කාලයට හැසිරෙන / පිටරටකට අයත් / යමකු වෙනුවෙන් පෙනී සිටින්නා /කිසිවෙකුට දෙවනි නොවන යන අදහස් දෙන තනි පද ඇතුළත් වරණය තෝරන්න.

1. නිශාචාරී ,විදේශීය , නියෝජිතයා , අද්විතීය
2. නිශාචාරී ,විදේශීය , කෘතවේදියා , අද්විතීය
3. වනචාරී ,විදේශීය , නියෝජිතයා , අද්විතීය
4. වනචාරී ,විදේශීය , අද්විතීය , නියෝජිතයා

❖ **23 සහ 24 වාක්‍යවල උක්ත රූපය වැරදියට යොදා ඇති වාක්‍ය තෝරන්න .**

(23) 1. ධනය ඇත්තන් මුදල් වියදම්කොට පින් දහම් කරති .
2. මමද එම් එම දින
3. නගර දෙකක් සතුරන් අතට පත්විය .
4. අයෙක් සිටියෝ වාද ඇසුමට

(24) 1. ඒ පර්වත ශිඛර අප විසින් දක්නා ලදී.
2. මිනිස්සු ගස් කපද්දී අපි එතැනට ගියෙමු .
3. සඟ වෙද ගුරු ගොවි කම්කරු බල ඇණියෙන් සිවු දිග සැරසේවා !
4. ඔහු කෘෂි විද්‍යාවේ හසළ බුද්ධිමතකු විය .

❖ **මුලින් දී ඇති පදයට නිවැරදි අර්ථයක් සපයා නැති පිළිතුර තෝරන්න .**

(25) 1. කුරුල්ලා - සකලයා , වහලා , රිලවා , ඌරා
2. බක්කම්මා - ලොකු අම්මා , මහම්මා , බත් අම්මා , කොට අම්මා
3. කුදහප - විසිකරපං , ගහපං , දුවපං , බීපං
4. කැටුං - එකතුව , සමග , කැටුව , කරවල

(26) පෙළ පොතෙහි ඇති පහත කොටස් ඇසුරෙන් එහි පාඩම් මාතෘකා පිළිවෙළින් සොයන්න .

- ඒ මිහිපල් තෙමේ සතියක් පුරා නානා පූජා සත්කාර පවත්වා.
- භූමි හෙවත් පුෂ්ඨාධාන නම්.
- කඳුළු කඳක් බිම ඉසලා ..........
- මේ පින් බිම එකම දහම් දිවයිනකි.

1. අතීතයෙන් කතාවක් ,බසින් රස මවන සාහිත්‍යය , මේ අපේ උදාර වූ මාතෘ භූමිය , ආරාමයේ නිර්මාණ
2. අතීතයෙන් කතාවක් , ආරාමයේ නිර්මාණ , බසින් රස මවන සාහිත්‍යය , මේ අපේ උදාර වූ මාතෘ භූමිය
3. ආරාමයේ නිර්මාණ , බසින් රස මවන සාහිත්‍යය , මේ අපේ උදාර වූ මාතෘ භූමිය , අතීතයෙන් කතාවක්
4. මංතනන්නෝ , ගුත්තිල වෙණ නද , බැද්දේගම , ආරාමයේ නිර්මාණ

(27) අ - ඔබේ සිත ස්වාමියා නොව දාසයා කරගන්න.
ආ - නයාට ගසා පොල්ල වරද්දාගන්න එපා.
ඉ - ලැල්ලට පාගලා ගියා.
ඊ - සැලෙන පහන් සිළු වැනි රඟන ලිය සැදී.

ඉහත වගන්ති හැඳින්වෙන නිවැරදි පිළිතුර වන්නේ ,
1. ආප්තෝපදේශ , ප්‍රස්තාව පිරුළු , උපමා , රූඪී පද
2. ආප්තෝපදේශ , ප්‍රස්තාව පිරුළු , රූඪී පද, උපමාවක්
3. ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ , රූඪී පද, උපමාවක්
4. ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ, උපමාවක් , රූඪී පද

(28) තොරොක්කෝව , හුණුවටයේ කතාව , බුත්සරණ , අමාවතුර යන ග්‍රන්ථවල කතුවරු නිවැරදි ව ලියා ඇති පේළියට යටින් ඉරක් අඳින්න.
1. ඊයුනොසුකෙ අකුතගාවා, හෙන්රි ජයසේන, ගුරුළු ගෝමී, විද්‍යා චක්‍රවර්ති
2. ඊයුනොසුකෙ අකුතගාවා , ගුරුළු ගෝමී , හෙන්රි ජයසේන, විද්‍යා චක්‍රවර්ති
3. ඊයුනොසුකෙ අකුතගාවා, හෙන්රි ජයසේන, විද්‍යා චක්‍රවර්ති , ගුරුළු ගෝමී
4. ඊයුනොසුකෙ අකුතගාවා, විද්‍යා චක්‍රවර්ති , ගුරුළු ගෝමී, හෙන්රි ජයසේන

❖ 29 සිට 31 දක්වා ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව වැරදි එක් වාක්‍යයක් ඇත. අදාළ පිළිතුර තෝරන්න.

(29) 1. අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
2. ඔවුහු දක්ෂ ශිෂ්‍යයෝලු .
3. ගොත්තු දෙදෙනෙකු ගැල ඇද්දාහ .
4. වෙරළ දිගේ සැරසිල්ලක් මෙන් හරිත වර්ණ ශාකයෝ පෙනෙන්නට වූහ.

(30) 1. ළමයින් විසින් චිත්‍ර අඳිනු ලැබේ.
2. අශෝක රජතුමා දැහැමි පාලකයෙක් විය.
3. කුමාර තෙමේ ස්නානය පිණිස උයනට ගියාය.
4. සියලු මිනිසුන් සත්‍ය ගරුක විය යුතුය.

(31) 1. දරුවන් වැඩිහිටියන් ට ගරු කිරීම වටී.
2. අප විභාගයට උනන්දු වන්නේ කවදාද ?
3. සිසුහු පන්තියට පැමිණ ඇත.
4. නුඹලා සියලු කටයුතු සාර්ථකව නිම කළෙහුය.

(32) A. මම හාන්සි පුටුවේ වාඩිවීමි. දරුවා ද ඉදිරියේ ඇති පුටුවේ වාඩි විය.
B. ඔබ හොඳින් පාඩම් කළ යුතු ය. විභාගයෙන් ජය ගත හැක
C. ගංවතුර ගලා ආවේය . ගෙවල් සියල්ල ද යටවිය.
D. ගුරුවරයා විද්‍යාගාරයට ගියේය. සිසුහු ද විද්‍යාගාරයට ගොස් වාඩිවූහ.

ඉහත වාක්‍ය තනි වාක්‍ය වශයෙන් ගැලපීමේදී එකතුකරන පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වන්නේ ,

E. විගස ම F. වූ විට G. හොත් H. නිසා

1. F, G, E ,H 2. F, E, G, H 3. G, F, H, E 4. G, H, F, E

❖ පහත ප්‍රකාශවලින් කියැවෙන පරිදි නිවැරදි අදහසට යටින් ඉරක් අඳින්න.

(33) "මවුගුණය ඇති අය දරුවන් දිනිය යුතු වෙයි
රියැදුරු මනා වූ ලැබිය යුතු වූ සේම අස්රිය, "

1. මවුගුණ , මුදුගුණ මනා වූ රියදුරෙක් ලබාගත යුතු බව
2. මවුගුණය මුදුගුණය ඇතිනම් දරුවන් ලැබිය යුතුය
3. යම් දෙයක් වේනම් එය සුදුස්සාට ම අයිති විය යුතු බව
4. යමක් ලැබිය යුත්තේ මවුගුණ ඇති අය පමණි

(34) <u>ජනශ්ච</u> <u>වාක්සුධා</u> සුතීර්
<u>මණි</u> සුතශ්ච <u>රෝහණ:</u>

ඉහත ඉරිඇඳිපදවල නිවැරදි අර්ථය වන්නේ,

1. ජනතාව ,යහපත් වචන , රුහුණු , මැණික්
2. ජනතාව , රුහුණු , මැණික් ,යහපත් වචන
3. යහපත් වචන ,ජනතාව, මැණික්, රුහුණු
4. ජනතාව ,යහපත් වචන ,මැණික්, රුහුණු

(35) ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය යනුවෙන් අදහස් වන්නේ ,
1. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව, ව්‍යවහාර යෙදුමකි.
2. වස්තුවක් තවත් වස්තුවකට ආරෝපණය කිරීම, නිරන්තරයෙන් අභ්‍යාස කිරීම.
3. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව, නිරන්තරයෙන් අභ්‍යාස කිරීම.
4. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව, නිශ්චිතාර්ථය දැක්වීම.

(36) සාවද්‍ය කියමන තෝරන්න.
1. සිංහල අක්ෂර මාලාවට අලුතින් එක්කොට ඇති "ෆ" ශබ්දය අඝෝෂ අකුරකි.
2. කර්මකාරක වාක්‍යයක කර්මය උක්ත වී කර්තෘ අනුක්ත වේ.
3. සිංහල අක්ෂර මාලාවේ අක්ෂර 60ක් ඇති අතර එය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.
4. අක්ෂර උපදින ස්ථාන අනුව සිංහල අක්ෂර වර්ග කළ නොහැකිය.

(37) අ. "වල් බිහි වී ගිය හේනේ මම තනියම කාන්සියෙන් කුඹුර කොටනවා"
ආ. "නව වැස්සට වැව පිරිලා කෙකටිය මල් ඒ අතටයි මේ අතටයි නැමී වැනෙනවා"
ඉ. "නීල ගොයම කිරි වැදිලා රන් අස්වනු නෙලන දාට"
ඊ. "බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට "
ඉහත "අ" -"ඊ" දක්වා පද්‍ය පාඨවලින් කුළු ගැන්වෙන රස භාවයන් පිළිවෙළින් පෙන්වන පිළිතුර තෝරන්න .
1 . නව දිවියක අපේක්ෂා, බොහෝ දුක් උසුලන බව, මෝදුවන ප්‍රේමණීය හැඟීම් , ජීවිතයේ කටුකත්වය
2 . ජීවිතයේ කටුක වූ තනිකම ,මෝදුවන ප්‍රේමණීය හැඟීම්, නව දිවියක අපේක්ෂාවන් , බොහෝ දුක් උසුලන බව
3 . ජීවිතයේ කටුක වූ තනිකම ,බොහෝ දුක් උසුලන බව, නව දිවියක අපේක්ෂා, මෝදුවන ප්‍රේමණීය හැඟීම්
4. නව දිවියක අපේක්ෂා, ජීවිතයේ කටුකත්වය ,මෝදුවන ප්‍රේමණීය හැඟීම්, බොහෝ දුක් උසුලන බව

(38) ඉරි ඇඳි පදවල නිවැරදි අර්ථය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
- <u>සබවස</u> කුලුණු මෙත් මුදිතා දහම් සැම.
- සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කිරීම <u>ආකස්මිකව</u> කළ හැකි දෙයක් නොවේ .
- ටී. බී ජයා මහතා අමරණීයත්වයට පත්කරන <u>ජීවමාන ස්මාරකය</u> මරදානේ සහිරා විද්‍යාලයයි.
- අද අප මෙහි සිටින්නේ විප්ලවයේ <u>විපුල පල</u> භුක්ති විඳින අය ලෙස ය .

1. ඉහළ ප්‍රතිඵල, හේතුවක් නැතිව ,සත්‍ය වචනය, ජීවයෙන් පිරුණු සිහිවටන
2. ඉහළ ප්‍රතිඵල හේතුවක් නැතිව , ජීවයෙන් පිරුණු සිහිවටන ,සත්‍ය වචනය
3. සත්‍ය වචනය , හේතුවක් නැතිව ,ඉහළ ප්‍රතිඵල , ජීවයෙන් පිරුණු සිහිවටන
4. සත්‍ය වචනය , හේතුවක් නැතිව , ජීවයෙන් පිරුණු සිහිවටනය ,ඉහළ ප්‍රතිඵල

(39) පහත (අ) ,(ආ ) කොටස් යටතේ දැක්වෙන නම් හා එමගින් සැදී ඇති සංඛ්‍යා වඩාත් නිවැරදි ලෙස එකිනෙකට ගැළපෙන වරණය වන්නේ ,

| | |
|---|---|
| A. ද්විතීය | E. 15 |
| B. දස | F. 16 |
| C. එකොළොස් | G. 06 |
| D. ෂඩ් | H. 02 |

1. AE 2. BF 3. DG 4. DF

(40) විශේෂාංග ලිපි රචනයේදී අවධානය යොමු කළ යුතු කරුණු අතර එක් කරුණක් සාවද්‍ය වේ. එය තෝරන්න.
1. භාෂාව සරල විය යුතුයි.
2. සංක්ෂිප්ත ව අදාළ කරුණු පමණක් ලිවිය යුතු ය .
3. ශීර්ෂ පාඨ සිත් ගන්නා සුළු විය යුතු ය .
4. ලේඛනය වඩාත් හෘදයාංගමව ඉදිරිපත් කළ යුතු නැත .

*****

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation -2016

| | | |
|---|---|---|
| 10ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රය<br>சிங்கள மொழியும் இலக்கியமும் வினாத்தாள் -11<br>Sinhala Language & Literature Paper 11 | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි .**

(01) අංක i සිට x දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. අ) සිංහල අක්ෂර මාලාවෙහි ඇති අඝෝෂ අක්ෂර දෙකක් ලියා දක්වන්න.
ආ) සිංහල අක්ෂර මාලාවේ ඇති කෙටි ස්වර දෙකක් ලියන්න.

ii. පහත සඳහන් වාක්‍යයෙහි පවතින අක්ෂර වින්‍යාසය සදොස් වචන දෙක හඳුනාගෙන එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

භාවික ගුණය යනු රසිකයාගේ භාවයන් ප්‍රබෝදවත් කොට ඔහු මැනවින් අත්දැකීමට සහබාගී කරවා ගැනීමේ හැකියාවයි.

iii. පහත සඳහන් තත්සම ශබ්ද සිංහලයට බිඳෙන විට ඒවා සකස් වන ආකාරය ලියා දක්වන්න.
අ) චන්දන ............... ආ) ශාසන ...............

iv. පහත වාක්‍යයේ ඉරි ඇඳි පද අයත්වන්නේ කවර ව්‍යාකරණ වර්ගයටදැයි දක්වන්න .
අ) ඔහු තම <u>පෞද්ගලික</u> යහපත අත්හළේය.
ආ) ටී.බී ජයා මහතා උදා වූ <u>අයහපත්</u> තත්ත්වය වටහා ගත්තේය.

v. අ) පහත වාක්‍ය කර්මකාරකයට හරවන්න.
විදුහල්පතිතුමා ශිෂ්‍යයෙකු කැඳවයි.
ආ) පහත වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.
කම්කරුවා විසින් තම සේවා කටයුතු ස්වාමියාට පහදා දෙන ලදී.

vi. පහත පාඨයෙහි ඇති උපමාව සහ රූපකය වෙන් කර දක්වන්න.
එතෙපුල් නමැති අමාහැල්ලෙන් කෝ ගිනිකඳ නිවී ගිය.

vii. වී ගොවිතැන ආශ්‍රිත ව යෙදෙන පහත වචනවල අදහස ලියන්න.
අ) කලවිට ............... ආ) උප්පිඩ ...............

viii. කාව්‍ය නිර්මාණයක විශිෂ්ටත්වය සඳහා හේතුවන පහත කරුණු කෙටියෙන් හඳුන්වන්න.
අ) ප්‍රතිභාව -
ආ) අපූර්වත්වය -

ix. පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.
අ) ඕ තොමෝ ගමට ගියහ.
ආ) ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.

x. පහත අවස්ථා සඳහා යෙදිය හැකි ප්‍රස්තාව පිරුළු ලියා දක්වන්න.
අ) අගයක් නොමැති වීම .....................
ආ) අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම..................... (ලකුණු 2x10=20)

අ.පි.බ.

(02) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

- ❖ අන්තර්ගත විය යුතු කරුණු
- ❖ ඡේද සංඛ්‍යාව
- ❖ කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- ❖ යොදා ගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබාගන්න.

(අ) අධ්‍යාපනය රටක සංවර්ධනයට දායක වන ප්‍රබලතම සාධකයකි. එමගින් පුද්ගල හැකියා හා ශක්තීන් වර්ධනය කළ හැකි ය. දැනුම ලබාගැනීම ම අධ්‍යාපනය නොවේ. විභාගය සමත්වීමේ සංඛ්‍යාව ඉහළ යාම රටකට වාසනාවකි. ඉන් රටට හෝ සමාජයට පුද්ගලයා බරක් නොවිය යුතු ය. රටේ සංවර්ධනය සහ අධ්‍යාපනය බද්ධ විය යුතු ය.

(ආ) ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. ආහාරයෙන් ස්වයංපෝෂිත රටක් කිරීම සඳහා අතීතයේ මෙන් ම වර්තමානයේ ද විවිධ කෘෂිකාර්මික ව්‍යාපෘති ආරම්භ කර ඇත. එහෙත් සංවර්ධන ඉලක්ක කරා හඹායෑමට නම් කාර්මික අංශය ද දියුණු කළ යුතු ය. මෙහිදී දේශීය සම්පත් උපයෝගී කොටගෙන, ලෝක වෙළෙඳපොළ ආකර්ෂණය කළ හැකි, නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සුදුසු ය. ඒ සඳහා උචිත ක්‍රියාමාර්ග කෙබඳු විය යුත්තේ ද ?

(ඉ) අද මහා මාර්ගවල ධාවනය වන වාහන සංඛ්‍යාව අති විශාලය. රියදුරෝ එකිනෙකා හඹායමින් තරගයක යෙදෙති. මාර්ග නීති නොපිළිපදින නිසා මාර්ග අනතුරු දින දින ඉහළයයි. පදිකයෝ ද මාර්ග නීති පිළිපදින්නෝ නොවෙති. මාර්ග අනතුරු වළකාලීමට නම් රියදුරන්ගේ හා පදිකයන්ගේ යන දෙකොටසෙහි ම අවධානය අතිශය පුළුල් විය යුතු ය.

(ඊ) ජලය ස්වාභාවික සම්පතක් වන අතර පරිහරණයේ දී අපට විශාල වගකීමක් ඇත. ජලය ප්‍රයෝජනයට ගනිමින් විදුලිබලය නිපද වේ. මේ අනුව ජලය හා විදුලිය අපතේ යැවීම නිසා රට තුළ විවිධ ගැටලු පැන නැඟී ඇත. තම නිවෙස්වල එදිනෙදා කටයුතු කර ගැනීමේ දී මේ පිළිබඳ ව සැලකිලිමත් වීම රටට ජාතියට කරන සේවයකි.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන 40 – 45 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

වර්තමාන සංවර්ධන ක්‍රියාවලියේ දී උපරිම අන්දමින් සම්පත් පරිහරණය කෙරේ. භෞතික සම්පත් වේගයෙන් ක්ෂය වන බැවින් අනාගත පරම්පරාවට ඒවා පරිහරණය කිරීමට අවස්ථාවක් නොලැබෙනු ඇත. ඒ නිසා සම්පත් භාවිතය අරපිරිමැස්මෙන් කළ යුතු ය. මේ අදහස ධරණීය සංවර්ධන සංකල්පයට අන්තර්ගත වී ඇත. වර්තමාන අවශ්‍යතා ඉටු කර ගනිමින් අනාගත පරම්පරාවේ අවශ්‍යතා සඳහා ද සම්පත් පරිහරණය කිරීමේ අවශ්‍යතාවක් ලබා දීම ඉන් අදහස් කෙරේ. මේ අනුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය. ජනතාව වෙනුවෙන් ලබා දෙන පහසුකම්වල දී සම්පත් සංරක්ෂණය සඳහා ජනතා සහභාගිත්වය බිඳී ගොස් ඇත. නළ ජලය අපතේ හැරීම මෙයට හොඳ උදාහරණයකි. එවැනි අවස්ථාවලින් වැළකී සිටීමටත් අන් අය ඒවායින් වළක්වාලීමත් තුළින් සම්පත් සංරක්ෂණ ක්‍රියාවලියට පහසුවෙන් අපට දායක විය හැකිය. සංවර්ධනය වෙමින් පවතින රටක ඉදිරි සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී දේශීය සම්පත් ප්‍රයෝජනයට ගතහැකි අයුරින් සැලසුම් කිරීම වැදගත් ය.

(ලකුණු 10)

(04) පහත සඳහන් පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ගැඹර තරසර ගුණැති නුවණින.
අවදිකෙරුවා අපේ දේශය.
පිරුණු සත්ගුණ මහාසාගර.
සදිසි පින්බර දිරිය මව ඔබ.

පවර කිතුරස පැතිර ලෝකය.
දනන් තුඩ තුඩ රැඳුණු නාමය.
ඔබය ශක්තිය නිමල ශක්තිය.
අභීතය කටහඬෙහි රාවය.

ඇණුම් ඇ නෙක බැණුම් අබියස.
පහන්ටැඹ සේ නොම සැලී හිඳ.
රටක යායුතු ගමන මාවත.
යුගෙන් යුගයට හෙළිකළා ඔබ.

නිරෝගී සුව සැදේවා !
දීගාසිරි සැප ලැබේවා !
දැයේ පින්බර දිරිය මාතා
දිනේ දින දින දිනේවා !

i. මෙම කවි පංතියෙන් කියැවෙන තැනැත්තිය කවුරුන් විය හැකි ද?
ii. මෙහි සඳහන් අය තුළ පවතින ගුණයන් දෙකක් ලියන්න.
iii. මෙහි සඳහන් උපමාවන් දෙකක් ලියන්න.
iv. මෙහි දැක්වෙන කවියාගේ ප්‍රාර්ථනය වාක්‍යයක් සේ ලියන්න.
v. පහත පදවල අරුත් ලියන්න.
    I. තරසර ගුණැති    II. නිමල ශක්තිය

(ලකුණු 2x5=10)

(05) වීර වික්‍රමගම, ශ්‍රී සුභූති විද්‍යාලයේ කලා සංගමයේ ලේකම් ඔබයැයි සිතා පාසලේ පැවැත්වෙන සිංහල අවුරුදු උත්සවය සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා ආලෝක පහසුකම් ඉල්ලමින් ප්‍රදේශයේ එබඳු පහසුකම් සපයන ආයතනයකට යවන ලිපිය සකස් කරන්න. (වචන 125ක් පමණ )

**නැතහොත්**

වස විසවලින් යුතු ආහාර ගැනීමෙන් මිනිසා දිනෙන් දින රෝගී තත්ත්වයට ගොදුරුවෙයි. මේ පිළිබඳ ව සිතන පියල් නම් තරුණයෙක් වගා වැඩසටහනක් දියත් කරයි. පියල්ගේ වස විස නැති ගොවිපළ ප්‍රදේශයට ම සම්පතකි. එය ඔහු ආරම්භ කළ අයුරු , වගා කිරීම හා බෝග වෙළෙඳාම ආදී තත්ත්වයන් දක්වා ගොවිපළ දියුණු කිරීම පිළිබඳව ද කරුණු දක්වමින් පුවත්පතකට විශේෂාංග ලිපියක් ලියන්න. (වචන 125ක් පමණ සෑහේ )

(ලකුණු 15)

*****

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation -2016

| | | |
|---|---|---|
| 10ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රය<br>சிங்கள மொழியும் இலக்கியமும் வினாத்தாள் -111<br>Sinhala Language & Literature Paper 111 | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

❖ **(01), (02), (03) හා (04) යන ප්‍රශ්නවලටත් (05), (06), (07) යන ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

❖ **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි .**

(01) (1) සිට (x) තෙක් ඇති කොටස්වල සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "දරුව, මසු දහස තොපට අභිප්‍රාය ද" ?
 අ) "දරුව" යන්නෙන් අමතන්නේ කාටද ?
 ආ) මෙසේ ඇසුවේ කවුරුන්ද ?

ii. "වර වෙණ නද අසමින් සිත සතොසිනි
 සර හැර සියොතුන් පියපත් විදමිනි
 ...........................................................
 ........................................................... "
 අ) මෙම කවියේ ඉතිරි දෙපාදය සම්පූර්ණ කරන්න.
 ආ) සර හැර යන්නෙහි අර්ථය දක්වන්න.

iii. අ) ජාතක කථාවක ආකෘතිය නම් කරන්න.
 ආ) පන්සිය පනස් ජාතක කතා පොතේ මූලාශ්‍ර කෘතිය නම් කරන්න.

iv. අ) "The village in the jungle" කෘතියේ කතුවරයා කවරෙක්ද ?
 ආ) මෙම කෘතිය සිංහලයට පරිවර්තනය කළේ කවුරුන් ද?

v. "නොබා මැනව දේවයන් වහන්ස, රාජ්‍ය සුවය අනුභව කළ මැනව."
 අ) මෙසේ කියන්නේ කවුරුන් ද ?
 ආ) මෙහි දේවයන් වහන්සේ යනුවෙන් අමතන්නේ කාටද ?

vi. "ඔව්, එයත් මෙහෙ හිටියා. උඹ ළඟ සල්ලි හෙම තියෙනවද ගෑනියෙ " ?
 අ) මෙය කා විසින් අසන ලද්දක් ද?
 ආ) "එයත් " යනුවෙන් දක්වා ඇත්තේ කවරෙකු පිළිබඳව ද ?

vii. අ) "සංයුක්ත නිකායට්ඨ", කතාව කුමන යුගයක ලියවුණක් ද ?
 ආ) ජනකවිය හා සබැඳි ජන ක්‍රීඩා දෙකක් නම් කරන්න.

viii. උම්මග්ග ජාතක කතාවෙහි එන උපමා දෙකක් ඔබට නිර්දිෂ්ට කොටසෙන් ගෙනහැර දක්වන්න.
 1.
 2.

ix. යම් කාර්යයක් කිරීමේ දී විමසිලිමත් වීම ඉතා අවශ්‍යය. එසේ නොවුවහොත් එම කාර්යය ඉටු නොවේ. මේ අදහස කියවෙන උපදේශාත්මක කවිය ලියන්න.

x. දිමුතු යසස් වන් කුසුම සරාගේ
 නුමුතු සුවඳ මල් පැලඳ සරාගේ
 "සරාගේ "යන පදයෙන් අර්ථ දෙකක් දැක්වේ. ඒවා වෙන වෙනම ලියන්න. (ල.2x10=20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. "**අභිමතාර්ථසාධක** වූ චින්තාමාණික්‍යයක් බඳු වූ මාගේ බෝධිසත්ත්වයන් වහන්සේගේ තේජසින්ම පස් මිටක්වත් **කැටක්වත්** නුවර දිසාවට දමන්නට තබා සිතිනුත් සිතූ එකද සත්ත්වයෙක් නැත්තේය."

අ) මෙම පාඨයෙහි සඳහන් උපමාව හා උපමේය වෙන්කර ලියන්න.
ආ) ඉරි ඇඳි පද දෙකෙහි අර්ථය වෙන වෙනම ලියන්න.

ii. සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

අ) මෙම කවියෙන් කියැවෙන සිදුවීම කෙටියෙන් ලියන්න.
ආ) මෙහි සඳහන් සත්ත්ව කොට්ඨාසය නම් කරන්න.

iii. "මේ ගම දැන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක්ගත් කාලකණ්ණි ගමකි. ළමයින් හා මහල්ලන් නැසී යන්නාක් මෙන් ගමත් දැන් නැසී යයි."

අ) මේ ගමෙහි පළමුව විනාශය ට පත් වූ නිවස කාගේද ?
ආ) එම නිවසෙහි සිටි පුද්ගලයින්ට සිදුවූයේ කුමක්ද?

iv. "මේ අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව බඩැ බත් කඩ පමණකටත් අස්වාමික කරවා නිශ්ශබ්ද සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහු බඳවා පියමි."

The National e-learning Portal for the General Education

අ) මෙම පාඨය කීවේ කවුද ? කීවේ කා හටද ?
ආ) එසේ කීමට හේතුව කුමක්ද ?

v. රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද
මිණි බරණින් සැදූ මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද

අ) ඉහත කවියේ පළමු පද දෙකෙන් කුමක් අදහස් කෙරේද?
ආ) උත්තමයන්ටත් විපත් සිදුවන බව පෙන්වන කවිපදය කුමක්ද ?

(ලෑ: 4x5=20)

❖ **3 හා 4 ප්‍රශ්න සඳහා පිළිතුරට වචන 150ක් පමණ සෑහේ.**

(03) ගුත්තිල කාව්‍ය උසස් කාව්‍ය කෘතියක් බවට අගය කළ හැක්කේ ,

අ . උපමා භාවිතය හා
ආ . කවියා සතු අතිශයෝක්ති වර්ණනා නිසාය.

එක් කොටසකට නිදසුන් දෙක බැගින් දක්වමින් "ගුත්තිල වෙණ නද" පාඩම ඇසුරින් මෙය පැහැදිලි කරන්න.

(ලෑ: 15)

**නැතහොත්**

බැද්දේගම නවකතාව සාර්ථක නවකතාවක් වී ඇත්තේ ,

අ . ලංකාවේ දුෂ්කර පළාතක ජන ජීවිතය සානුකම්පිතව විස්තර කිරීමත්
ආ. භාෂාව භාවිත කොට ඇති ආකාරයත් නිසාය .

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන සනාථ කරන්න.

(ලෑ: 15)

(04) උම්මග්ග ජාතක කතා කරුවා ,
අ . මහෞෂධ පණ්ඩිතයින්ගේ උපායශීලීත්වයත්
ආ. ඒ තුළින් කේවට්ට බමුණා උපහාසයට ලක් කිරීමත් යන කරුණු දෙක ම එකවර ගෙනහැර දක්වයි.
එක් කොටසකට නිදසුන් දෙකක්වත් දක්වමින් මෙය පැහැදිලි කරන්න.

(ල: 15)

**නැතහොත්**

ජනකවියා ආයාසයකින් තොරව
අ . උචිත දේශීය උපමා භාවිත කරයි.
ආ. ජීවිතයට උපදේශයක් ද ලබාදේ.
"හානා හීය පානා ඇඬහැරෙන් දැනේ" කවි පන්තිය තුළින් එක් කොටසකට නිදසුන් දෙක බැගින්වත් දක්වමින් සාකච්ඡා කරන්න.

(ල: 15)

❖ **(05), (06), (07) යන ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**
**((05), (06), (07) යන ප්‍රශ්න සඳහා පිළිතුරකට වචන 100 ත් 125 ත් අතර සෑහේ .)**

(05) උසස් රස වින්දනය හමුවේ සමාජයක එකිනෙකා කෙරෙහි වෛරය, භය, සැකය තුරන්ව යන ආකාරය 'ගුත්තිල වෙණ නද' පාඩම ඇසුරෙන් නිදසුන් තුනක් සහිතව විමසන්න.

(06) අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී සහෘදයාගේ සිත දයානුකම්පාවෙන් පුරවාලීමට "බැද්දේගම " කතුවරයා පෑ දක්ෂතාවය අදාළ නිදසුන් තුනක්වත් දෙමින් පහදන්න.

(07) උම්මග්ග ජාතක කථාවේ සාර්ථකත්වයට එක් හේතුවක් වී ඇත්තේ එහි යොදාගත් භාෂා රීතියයි . නියමිත කොටස ඇසුරෙන් නිදසුන් තුනක්වත් ගෙනහැර දක්වමින් මේ කියමන සාකච්ඡා කරන්න.

(ල: 10)

*****